
# බිනර මිනිසා



**සං**ස්කෘතයේත් පාළියේත් මිශ්‍ර සිංහලයේත් **අභි** යන උපසර්ගය යොදන්නෙ උසස් නොහොත් උතුම් යන අර්ථයෙනුයි. ඒ අනුව අභිධර්මය කියන්නෙ ඉතා ගැඹුරු නොහොත් ඉතා උසස් ධර්මයටයි. ශුද්ධ සිංහලයෙදි අභිධර්මය යන්න **බිදම්** යනු වෙනුත් **බි** යන්නට **වි** යන්නත්, **ද** යන්නට **ජ** යන්නත් ආදේශ වී **විජම්** යනුවෙන් ද යෙදෙනව.

උතුම් දහම **බිදම්** යනුවෙන් හැඳින්වෙන නිසා **බිනර** යන්නෙන් උතුම් නරයා නොහොත් **උතුම් මිනිසා** යන තේරුම ලැබෙනව. ඉතාමත් උතුම් තත්වයට මිනිසෙකු පත් වන්නේ රහත් වුනාමයි. බුදුවන්නෙත් පසේ බුදුවන්නෙත් රහත් වෙලයි.

බුදු පසේ බුදු මහ රහතන් අතර ගුණාත්මක වෙනස්කම් තියන හැම දෙයක්ම මැනිය හැකි භෞතික වෙනස්කම් තියන මෙලොවදි පමණයි. මැනිය හැකි, කිරිය හැකි, සංසන්දනය කළ හැකි දේවල් නැති ශූන්‍ය ධර්මයක් වන නිවනෙදි බුදු, පසේ බුදු, මහරහතන් අතර සංසන්දනය කළ හැකි කිසිම වෙනසක් නැහැ. නිවන් දුටු කවුරුත් පත්වන්නෙ එකම නිවනටයි.

ඉතාම උසස් නොහොත් බිනර යනුවෙන් හැඳින්විය හැක්කෙ නිවනට පත් උත්තමයන් විතරයි. වෙන ලෙසකින් කියතහොත් රහතන් වහන්සේලාට විතරයි. වස්සාන කාලයේ ඇසළ, නිකිණි වැනි මාසවල නිරන්තරව භාවනානුයෝගීව වෙසෙන භික්ෂූන් වැඩි දෙනෙකුම මේ රහත් තත්වයට පත්වන්නේ බිනර මාසයේ දී යි. ඒ අනුව **බිනර මාසයට** ඒ නම ලැබී ඇත්තේ ඒ මාස ය රහතන් වහන්සේලා නොහොත් අබිනරයන් වැඩි පුරම බිහිවන මාසය නිසා විය යුතුයි.

රහතන් වහන්සේලාගේ විශේෂ ලක්ෂණයක් වන්නේ බාහිර භෞතික ස්වරූපයෙන් නරයන් වුනත් අභ්‍යන්තර අධ්‍යාත්මික ස්ව රූපයෙන් නරබව ඉක්මවූ සුවිශේෂ පුද්ගල යන් වීමයි. පෘතග්ජන භාවයට පදනම්වන මමත්වය නොහොත් තමා අන් සියල්ලන් ගෙන් වෙන් වූ වෙනම පුද්ගලයෙකැයි යන හැඟීම මුළුමනින්ම දුරුවීමයි.

උසස් නොහොත් **විශිෂ්ට** යන තේරුම දෙන ආරිය නාමයෙන් රහතන් වහන්සේලාව හැඳින් වෙන්නේ උන්වහන්සේලා දරන අබිනර ස්වරූපය නිසයි. ඒ සවරූපය මමත්වය නමැති සක්කාය දිට්ඨිය දුරුවෙන සෝවාන් භාවයේ සිට රහත්භාවය දක්වා ක්‍රම ක්‍රමයෙන් වර්ධනය වන්නක්. ඒ නිසයි සෝවාන්, සකෘදාගාමී, අනාගාමී, අර්හත් යන සියළු උත්තමයන් **බිනර** යන තේරුම දෙන ආරිය නාමයෙන් හැඳින්වෙන්නෙ.

බිනර ආයඝියන් වැඩිපුරම පහළවන මාසය බිනර ලෙස හැඳින්වීම අර්ථානුකූලයි. අදත් වස්සානයේ දී වස්වසන භික්ෂූන් වහන්සේලා කොතරම් සිටියත් බිනර මාසයේදී අබිනරයන් පහළවනු දක්නට නැත්තේ සැබෑ ලෙස භාවනානුයෝගීව වැඩවසන භික්ෂූන් වහන්සේලා හිඟ නිසා විය යුතුයි.

මමත්වය මුල්කරගෙන තමාට යම් යම් ආත්මාර්ථකාමී ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් කරන කිසිම භාවනාවක් පදනම් කරගෙන ආත්මීය භාවයෙන් මිදී නිවන් දකින්න බැහැ. නිවන යනු සිතක් සපුරා නිවී යාමයි. ඊර්ෂ්‍යා ක්‍රෝධ වෛර ආදිය දුරු වී පරාර්ථකාමී මෛත්‍රී කරුණා ආදී චිත්ත ස්වරූප පහළවන තරමටයි.

♦ ***මහාචාර්ය ටී. එස්. අබේවික්‍රම***

**Harrow UK**

## සංතෝෂයට මග

**ධ**ර්මය අසා එය වටහා ගෙන ඒ අනුව කටයුතු කරන්නෝ සැහීමට පත් නිවී සැනසුණු ඇත්තෝ වෙති. විවේකීව තනිව දිවිගෙවීම ඔවුන්ගේ ප්‍රීතිය වේ. ලොව ජීවත්වන සියළු සත්වයින් වෙත අවිහිංසාව දයාව දැක්වීම, ඔවුනට හිරිහැරයක් නොකිරීම ලෝ තුල්හි සැබෑ ප්‍රීතියට හේතු වන්නේය.

**සි**තින් කෝපය නසා දැමූ කල්හි සුවසේ නිදාගත හැකිය. කෝපය නිවා දැමීමෙන් ඔබ කිසිවිට දුකට පත් නොවේ. එසේ කෝපය වනසා දැමීම ආර්යයන්ගේ ප්‍රශංසාවට ලක්වෙයි. මිහිරි සිරසක්ද, විෂ සහිත මුල් ද ඇති කෝපය නැසීම ගැන ඔබ දුක්වන්නේ නැත

**කෙ**නෙක් තව කෙනෙකු රැවටීමට පත් නොකරත්වා! කෙනෙක් කිසිම තැනකදී තව කෙනෙකු පිළිකුල් නොකරත්වා ! කෙනෙක් කිසිවෙකු කෙරෙහි කෝප යෙන් හෝ නුරුස්නාකමෙන් යුතුව ඒ අයට දුකක් පැමිණෙත්වායි කිසිවිට ප්‍රාර්ථනා නොකරත්වා !

## The Way to Happiness

Solitude is happiness for one who is content,
who has heard the **Dhamma** and clearly sees.
Non-affliction is happiness in the world-
Harmlessness towards all living beings.
- Udana 10

Having killed anger you sleep in ease.
Having killed anger you do not grieve.
The Noble ones praise the slaying of anger
- with its honeyed crest & poison root -
for having killed it you do not grieve.
- Samyutta Nikaya II, 70

Let no one deceive another
or despise anyone anywhere,
or through anger or irritation
wish for another to suffer.
- Khuddakapatha 9


**Duke's Court Travel**

DUKE'S COURT TRAVEL

**Fly to Colombo**

| Airline | Fare |
| --- | --- |
| SriLankan Airlines | £260 + Taxes fr 12000 Air miles |
| Qatar Airways | fr £260 + Taxes |
| Kuwait Airways | fr £230 + Taxes |
| Emirates | fr £430 + Taxes |
| Etihad Airways | fr £245 + Taxes |
| Oman Air | fr £185 + Taxes |

Note: All fares mentioned are low season / terms & conditions apply.

**020 8748 3535**

204 King Street, London W6 0RA


## ධර්මපාල සැමරුම් උත්සවය

ලන්ඩන් බෞද්ධ විහාරයේ ආරම්භක ශ්‍රීමත් අනගාරික ධර්මපාල තුමාගේ 146 වෙනි ජන්ම දිනය සහ ලන්ඩන් බෞද්ධ විහාරය ආරම්භ කොට වසර 84 ක් පිරීම නිමිති කරගෙන 2010 සැප්තැම්බර් මස 18 දින සහ 19 දෙදින ලන්ඩන් බෞද්ධ විහාරයේ පැවැත්නෙ උත්සව කටයුතු මෙසේය

### 18 වෙනි සෙනසුරාදා

සවස 3 ට ආරම්භක දිනය වෙනුවෙන් පැවති තරඟයේ තෑගි සහ සහතික පත් ප්‍රදානය

5.00 ට විශේෂ අනුස්මරණ දේශනය - එකසත් ජනපදයේ විශ්වවිද්‍යාල කථිකාචාර්‍ය ආචාර්‍ය ආනන්ද වික්‍රමරත්න මහතා

6.30 ට බෝධිපූජාව

7.30 - මධ්‍යම රාත්‍රි දක්වා එක්සත් රාජධානියේ විහාරස්ථාන වලින් වැඩම කළ භික්ෂූන් වහන්සේලාගේ පිරිත් දෙශනය

### 2009 සැප්තැම්බර්19 ඉරූ දින

උදේ 7 ට සංඝයා වහන්සේලාට හීල් දානය
අනතුරුව ධර්මපාලතුමා ඇතුළු විහාරස්ථානයේ
දියුණුව පිණිස කටයුතු කළ ගිහි පැවිදි සියළු දෙනාට
පිංපැමිණවීම සහ සෙත් පැතීම
මේ උතුම් කටයුත්තට සහභාගිවන ලෙස
සුපින්වත් ඔබ සැමට ගෞරවයෙන් ආරාධනා කෙරේ.


**ඔබේ මුදල් පහසුව සුරක්ෂිතව සහ විශ්වාසදායකව ශ්‍රී ලංකාවට යැවීමේ එකම සේවය**



FAST CASH
SEND TODAY - COLLECT TODAY

**ඔබේ මුදල් අදම යවන්න - අදම ලබාගන්න**

* කොමර්ෂල්, හැටන් නැෂනල් සහ ලංකා බැංකු සමග එක්ව, දිවයින පුරා 500කට අධික ශාඛා ජාලයකින් එදිනම මුදල් ලබාගැනීමේ පහසුව
* ලංකාවේ ඕනෑම බැංකු ගිණුමකට මුදල් ක්ෂණිකව බැර කිරීම
* ඔබගේ NRFC/RFC විදේශ ගිණුම් වලට මුදල් බැර කිරීම
* රටවල් 120කට මුදල් යැවීමේ පහසුව
* ඔබගේ මුදල් මැද පෙරදිග අතරමැදියන් වෙත නොයා ක්ෂණිකව හා සෘජුවම ගිණුමට බැර කිරීමේ විශ්වාසය

£5

Commercial Bank · BOC · HNB · HSBC · Sampath Bank · People's Bank · Standard Chartered · MCG

**www.efastcash.biz**

**020 8886 4488**